සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
Co-operative Employees Commission (Southern Province)
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச். தஹநாயக மாவத்தை, காலி.
Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.

| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/01/01/05 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2026.08. 31 . |
|---|---|---|---|---|---|

<u>චක්‍රලේඛ අංක 02/2026(2)</u>

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 02/2026 චක්‍රලේඛය සංශෝධනය කිරීම.</u>

02/2026 චක්‍රලේඛයේ 1.3.4 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1.3.4.1. හැකි සෑම විටම අවම වශයෙන් තිදෙනෙක් මෙන්ම උපරිම වශයෙන් පස්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් තේරීම් මණ්ඩලයක් සඳහා පත්කළ යුතුය. විධායක ශ්‍රේණි සඳහා පස් දෙනෙකුගෙන් ද , මෙහෙයුම් හා සහාය ශ්‍රේණි සඳහා ඊට අඩු සංඛ්‍යාවකින් ද, තේරීම් මණ්ඩලය සමන්විත විය යුතුය. එකී පත්කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබාගත යුතුය. එකී යෝජිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනය සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කොට සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

1.3.4.2. තේරීම් මණ්ඩලයේ සංයුතිය

සමිතියේ සාමාන්‍යාධිකාරී තනතුර ඇතුළු අධීක්ෂණ සේවා තනතුරු සඳහා පහත සඳහන් සාමාජිකයන් ඇතුළත් කරගතයුතු වේ.

i. සමිතියේ සභාපති හෝ උප සභාපති.

ii. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක්.

iii. සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා නියෝජනය කරන මාණ්ඩලික නිලධාරියෙකු සහ සමිතියේ අධීක්ෂණ කටයුතු සඳහා පත්කර ඇති සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී.

iv. පුරප්පාඩු තනතුරට අදාළ වෘත්තීය දැනුම ඇති බාහිර ආයතනයක ( රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / සමුපකාර සමිතියක) විධායක මට්ටමේ නිලධාරියෙක්.

ලේකම් / செயலாளர் / Secretary 091-2232794
පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk

Scanned with CamScanner

1.3.4.3. මෙහෙයුම් ශ්‍රේණි සහ සහාය ශ්‍රේණිවලට තෝරා ගැනීම සඳහා වන තේරීම් මණ්ඩලයක සංයුතිය.

i. සමිතියේ සභාපති හෝ උප සභාපති.
ii. සමිතියේ ප්‍රධාන විධායක නිලධාරියෙකු. ( **ස.ණ.ස සමිතිවල සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කිරීමේ දී සමතියේ ප්‍රධාන විධායක නිලධාරියකු නොමැති අවස්ථාවල දී ස.ණ.ස. සමිති සංගමයේ විධායක නිලධාරියෙකු හෝ විවිධ සේවා සමිතියක විධායක නිලධාරියකු යොදවා ගැනීම කළයුතු වේ.)**
iii. සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ නියෝජිතයකු.

1.3.4.4.
**13.4.4 හි අනු අංක v පහත පරිදි සංශෝධනය විය යුතුය.**

**v. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමත කරවා ගතයුතු අතර, ලකුණු ලබා දීමේ නිර්ණායක ඇතුළත් අනුමත කරන ලද ක්‍රමවේදය සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**

**(සැ.යු.:- මා විසින් මේ සම්බන්ධයෙන් 2026.07.30 දින නිකුත් කර ඇති 02/2026(1) චක්‍රලේඛය මෙයින් අවලංගු කරමි.)**

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එල්.එස්.වර්ණකුලසූරිය,
ලේකම්( වැ.බ.),
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත් -
1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන .... සමූපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත. - කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා
3. විෂය නිලධාරී - දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා වෙබ් අඩවියට ඇතුලත් කිරීමට.

Scanned with CamScanner